**ශීර්ෂය 235 - නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්වාගණනය නොකළ මතය**

නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්වාගණනය නොකළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධි විධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික වියයුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරිමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

**(ආ)** නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ස්ථාවර වත්කම් උප ලේඛණයේ රු.33,831,556 ක අගයන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ලෙජරයේ ශේෂයන් හා සසඳා නොතිබුණි. මෙම දෙපාර්තමේන්තුව 2018 වර්ෂයේ සිගාස් පරිගණක වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබීම එයට හේතු වී තිබුණි. | උක්ත චක්‍රලේඛයේ 3.3 වගන්තිය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ දී එම වත්කම්වලට අදාළ ප්‍රධාන ලෙජර් ශේෂ වටිනාකම සැසඳිය යුතුවේ. එසේ නොවන යම් ශේෂ වේ නම් එම ශේෂ හඳුනාගන්නා තෙක් ජර්නල් සටහන් මඟින් එම වටිනාකම ප්‍රධාන ලෙජරයේ ශේෂය සංශෝධනය කළ යුතු වේ. | ඉදිරිපත් කොට ඇති කරුණ පිළිබඳව එකඟ වේ. මෙම දෙපාර්තමේන්තුව " ඒ " පන්තියේ දෙපාර්තමේන්තුවක් බවට පත් කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලුම් කරමින් 2018 සැප්තැම්බර් 13 දිනැති ලිපිය අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් මඟින් ජාතික අයවැය දෙපාර්තමේන්තුවට සහ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කොට ඇති අතර ඒ සම්බන්ධ ප්‍රගතියක් මෙම දෙපාර්තමේන්තුව වෙත වාර්තා වී නොමැත. |

**1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) විගණනයට ඉදිරිපත් කළ මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව ආදායම් නොවන ලැබීම් රු.13,463,776 ක් වුවද මූල්‍ය ප්‍රකාශ සමඟ වූ ඒසීඒ 3 ආකෘතියේ එය රු.14,746,626 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.1,282,850 ක වෙනසක් නිරීක්ෂණය විය. මෙම වෙනස සඳහා හේතු පැහැදිලි නොකෙරුණි. | මූල්‍ය ප්‍රකාශවල සඳහන් අගයන් අදාල ලේඛන සමඟ නොසැසඳෙන විටදී ඒ සඳහා හේතු පැහැදිලි කළයුතු වීම. | එකඟ වේ. |
| (ආ) 2018 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයට පියවන ලද රු.168,751 ක අග්‍රිම මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් වැය කිරීමක් ලෙස දක්වා නොතිබුණි. | විධිවිධාන ප්‍රකාරව නිවැරදිව මූල්‍ය ප්‍රකාශවල වාර්තා කළයුතු වීම. | එකඟ වේ. |

### 1.6.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තිය | වැඩ බැලීමේ පත් කිරීමක් සිදුකළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් වුවත්, දෙපාර්තමේන්තුවේ ලේකම් තනතුර 2014 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතියද, 2019 අප්‍රේල් 29 දිනය දක්වා එම තනතුර සඳහා නිත්‍ය පත්කිරීමක් සිදුකර තිබුණි. | ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරිපත් කොට ඇති කරුණු සමඟ එකඟ වේ. |
| (ආ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 880 | ඇප තැබිය යුතු නිලධාරීන් 07 දෙනෙකුගෙන් ඇප තැන්පත් ලබාගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි 880 අනුව රජයේ මුදල් හා මුද්දර භාරව කටයුතු කරන සහ වවුචර් සහතික කරන හා චෙක්පත් අත්සන් කරන නිලධාරීන් ඇප ආඥාපනතට අනුකූලව ඇප තැබිය යුතු වේ. | අධිකරණ අමාත්‍යාංශයෙන් මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද MOJ/E16/1/1/8 දරන 2016 ඔක්තෝබර් 11 දිනැති ලිපිය සහ MOJ/E16/1/1(8) දරන 2017 ඔක්තෝබර් 16 දිනැති ලිපිය අනුව අධිකරණ අමාත්‍යාංශය විසින් ඉදිරි කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කොට ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) එක් මූලධන වැය විෂයකට ලබාදී තිබූ රු.20,000 ක්වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | ඉදිරිපත් කොට ඇති කරුණු පිළිබඳව එකඟ වේ. |
| (ආ) පුනරාවර්තන වැය විෂයන් 08 ක හා එක් මූලධන වැය විෂයක ඉතිරි ප්‍රතිපාදන එකතුව රු.මිලියන 1.67 ක් වෙනත් පුනරාවර්තන වැය විෂයකට හා මූලධන වැය විෂයන් 02 කට මාරු කර තිබුණු අතර මාරු කිරීම් ප්‍රතිශතය ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 81 සිට 131 දක්වා වූ පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි. | - එම - | - එම - |
| (ඇ) වැය විෂයයන් 13 කට සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.මිලියන 18.97 කින් රු. මිලියන 6.43 ක ප්‍රතිපාදන ඉතිරිවීම් වාර්තා වී තිබුණු අතර එම ඉතිරිවීම් ප්‍රතිශතයක් ලෙස සියයට 06 සිට සියයට 88 දක්වා පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි. | - එම - | - එම - |
| (ඈ) වැය විෂයයන් 08 ක ප්‍රතිපාදන ඉතිරිවීම් වූ රු.මිලියන 4.34 ක් සඳහා දක්වා ඇති පැහැදිලි කිරීම් පිළිගැනීමට අසීරු විය. | - එම - | මූල්‍ය ප්‍රකාශනවල අදාල පැහැදිලි කිරීම් සංක්ෂිප්තව දක්වා ඇති අතර ඉදිරියේදී එය විස්තරාත්මකව දැක්වීමට කටයුතු කරන බව දැනුම් දෙමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 වර්ෂයේ කාර්යසාධන වාර්තාවට අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු හා කාර්යයන් 11 ක් දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂයේ දී දෙපාර්තමේන්තුව වෙත ඉන් ප්‍රධාන කාර්යයන් කිහිපයකට පමණක් අදාළ නීති සංශෝධන සඳහා නිර්දේශ 10 ක් ඉදිරිපත් වී තිබුණි. ඉන් නිර්දේශ 02 ක පනත් කෙටුම්පත් පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්වරයා දැනුවත් කර තිබුණු අතර එක් නිර්දේශයක සංශෝධන පිළිබඳ අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා දැනුවත් කර තිබුණි. එමෙන්ම කටයුතු නිම නොවී තවදුරටත් සාකච්ඡා මට්ටමේ පවතින නීති නිර්දේශයන් සංඛ්‍යාව 07 ක් විය. | නිර්දේශිත නීති සංශෝධනයන් පිළිබඳ කටයුතු සිදු කර කඩිනම්ව අදාල සංශෝධිත නීති වාර්තා අමාත්‍ය මණ්ඩලය හරහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළයුතු වීම හා කාලීනව ඒ පිළිබඳ අවශ්‍ය පසු විපරම් කටයුතු කළ යුතු වීම. | ඉදිරිපත් කොට ඇති කරුණු සමඟ එකඟ වේ. |
| (ආ) 2018 ඔක්තෝබර් 01 සිට දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය තුළ නීති කොමිෂන් සභා රැස්වීම් කැඳවා නොතිබුණු නිසා නෛතික කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කර නොතිබුණි. | කොමිෂන් සභා රැස්වීම් පැවැත්විය යුතු වීම | - එම - |

### 3.2 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කාර්යසාධනය සම්බන්ධ සැලැසුම් කිරීමේ දී දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යයන් 11 ක් පැවතුනි. ඒවායින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරි සැලැස්මෙහි සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කළ දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය පිළිබඳ විස්තරද, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක් මුදල් අවශ්‍යතා සැලැස්මද ඉදිරිපත් කර නොතිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වේ. | ඉදිරිපත් කොට ඇති කරුණු සමඟ එකඟ වේ. |

### 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 හා 2018 වර්ෂවලදී අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයෙන් පවරාදී තිබුණු මෝටර් රථ 03 ක අයිතිය 2019 මාර්තු 18 දින වන විටත් පවරා ගෙන නොතිබුණි. | මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම්වල වටිනාකමට මෙම වාහන ඇතුලත් වී ඇති නිසා අයිතිය පවරා ගැනීම කඩිනම් කළ යුතුවේ. | ඉදිරිපත් කොට ඇති කරුණු සමඟ එකඟ වේ. මෙහි සඳහන් මෝටර් රථ මෙම දෙපාර්තමේන්තුවට නිත්‍යානුකූලව පවරා දෙන ලෙසට 2017 ඔක්තෝබර් 26 දින සහ 2017 නොවැම්බර් 08 දින ලිපි මඟින් ඉල්ලුම් කොට ඇත. |